**ආගරපතන ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආගරපතන ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආගරපතන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව  විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව  ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ  මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 2 (ආ) (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට එරෙහිව පවරා ඇති නඩු දෙකක් පැවතියද, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයන්වලදී නිවැරදි කරන බව | නඩු පිළිබඳ හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවට නිකුත් කර තිබුණු ආයුර්වේද තොගයේ වටිනාකම රු.240,000 ක මුදල සභාවට අයකරගෙන නොතිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් ලෙසටද දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් තුළ අදාළ ණයහිමි ශේෂ ඇතුළත් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ වත්කම් රු.4,514,359 ක් හා වගකීම් රු.495,313 ක් ලෙස අඩුවෙන් දැක්වීම් හා ආදායම් රු.77,800 ක්, වියදම් රු.24,138 ක් හා රු.111,493 ක වගකීම් ලෙස වැඩියෙන් දැක්වීමේ වරද සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාළ අගයන් නිවැරදි ලෙස ගිණුම්ගත කරන බව | - එම - |
| (ඇ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පත්‍රය හා අදාළ උපලේඛනවලට අනුව ගිණුම් විෂයන් 04 ක රු.808,863 ක වෙනස සමාලෝචිත වර්ෂයේද නිවැරදි කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | වැරදි ලෙස දක්වා ඇති ආරම්භක ශේෂය නිවැරදි කිරීම සඳහා ජ'නල් අංක 41 හා 46 න් පිළිවෙලින් රු.102,700 ක් හා රු.52,134 ක් ලී බඩු හා සවි කිරීම් ගිණුම හා කාර්යාල උපකරණ ගිණුම හර කර ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම බැරකළ යුතු වුවත්, සමුච්චිත අරමුදල බැරකර තිබුණි. | ඉදිරි වර්ෂය තුළ දී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාවට ලැබිය යුතු රු.357,248 ක උසාවි දඩ අදාළ ආයතනයෙන් ගෙන්වා ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් කපාහැර තිබුණි. | තලවකැලේ නගර සභාවෙන් අප වෙත ලැබිය යුතු උසාවි දඩ මුදල් අය කරගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ආදායම් අයකර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුද්දර ගාස්තු හිඟය රු.1,526,100 ක් වූ අතර වර්ෂය තුළ හිඟයෙන් ලැබීම රු.1,708,100 ක් විය. ඒ අනුව රු.182,000 ක් සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත්, රු.556,520 ක් ලෙස රු.374,500 ක් වැඩියෙන් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | ඉදිරි වර්ෂය තුළ දී නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.752,300 ක දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරන බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂය රු.20,389,351 ක් වූ අතර ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය රු.19,422,323 ක් වුයෙන් රු.967,028 ක වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂය තුළ අදාළ ශේෂ තුලනය කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පනත්<br>-------<br>1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත හා ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසි | පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාලය ඉක්මවා ගොස් මාස 02 සිට වසර 09ක කාලයක් ඉක්මවා තිබුණ ආයතන 12 ක් හා ව්‍යාපාර 12ක පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන සඳහා බලපත්‍ර ලබාගැනීමට දැනුවත් කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>---------------------------- | | | |
| මු.රෙ. 571(3) | වසර 2 සිට 4 දක්වා කාලයක් පැවති රු.644,542 ක ශේෂ 22 ක් නියාදනය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>--------------------------- | | | |
| 1988මැයි 17 දිනැති අංක 22/1988දරණ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් බදු දේපල වසර 05 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද, එසේ කටයුතු නොකර 2008වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව පදනම් කරගෙන බදු අයකරමින් පැවතුණි . | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කළ ද, ඒ සඳහා නිසි ප්‍රතිචාර නොලැබුණු බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,211,805 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,579,585 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,959,000 | 2,916,056 | 2,755,710 | 2,089,498 | 1,958,038 | 2,521,992 | 1,701,193 | 1,929,151 |
| (ii) | කඩ කුලී | 94,800 | 4,356 | | 24,125 | 814,760 | 4,356 | 9,630 | 19,769 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,610,000 | 1,447,000 | 1,447,000 | - | 4,040,000 | 1,420,500 | 1,875,800 | - |
| (iv) | වෙනත් ආදායම් | 56,170,050 | 2,373,333 | 3,552,433 | 1,090,248 | 55,492,227 | - | 27,905,923 | 2,269,348 |
| | | 60,833,850 | 6,740,745 | 7,755,143 | 3,203,871 | 62,305,025 | 3,946,848 | 31,492,546 | 4,218,268 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධන**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු<br>-------------------<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.663,028 ක හිඟයක් පැවති අතර එයින් පෞද්ගලික දේපල 20 කින් වසර 10 කට අධික කාලයක් තුළ රු.145,058 ක් හිඟව පැවති අතර දේපල 92 කින් වසර 5 ත් 10ත් අතර කාලයක සිට රු.361,590 ක් අයවිය යුතුව පැවතුණි. | ආදායම් පරීක්ෂක නිලධාරියෙකු නොමැති වීම හේතු වී ඇති බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) වෙනත් ආදායම්<br>------------------<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ආයතන 13 කින් දැන්වීම් පුවරු ගාස්තු රු.778,700ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී ආදායම් අය කරගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>-------------------------------<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.519,248 ක් හා මුද්දර ගාස්තු රු.571,000ක් විය. | මුද්දර ගාස්තුවලින් කොටසක් අයකර ගැනීමට කටයුතු කර ඇති බව | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා පනතේ 79,84,85,92,93 හා 95 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පොදු කානු, කසළ කානු, ජල මාර්ග, වැසිකිළි යනාදි කාර්යන්ට අදාළ ඉදිකිරීමේ නඩත්තු කටයුතු හා ඒවා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කිසිදු පියවරක් අනුගමනය කර නොතිබුණි. | ගැසට් කළ යුතු මාර්ග හඳුනාගැනීම සිදු කරමින් පවතින බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව මල ඉවත් කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් හා ඊට අදාළ ගලි රථ සේවාව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ආදායම් ප්‍රමාණවත් නොවන බැවින් ඉටුකළ යුතු මහජන උපයෝගීතා සේවාවන් බොහෝමයක් අතපසු වී ඇති බව | පනතේ කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ III කොටසේ විධිවිධාන ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ මංමාවත් තැනීම, වැඩිදියුණු කිරීම, වීදි මාවත් නම් කිරීම පෞද්ගලික දේපල හිමිකරුවන්ගේ යහපත සඳහා මාර්ග ඉදිකිරීම, සභාව සතු මාර්ග ගැසට් කිරීම හා යනාදි කාර්යන් සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදල් යොදවා ඉටුකර නොතිබුණි. | ආදායම් ප්‍රමාණවත් නොවන බැවින් ඉටුකළ යුතු මහජන උපයෝගීතා සේවාවන් බොහෝමයක් අතපසු වී ඇති බව | - එම - |
| (ඈ) | ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව කාර්යයන් ඉටු කළ යුතු වුවද, ප්‍රදේශ 06 ක පාරිභෝගිකයින් 474 ක් වෙත රසායනාගාර පරීක්ෂාවකින් හා පිරිපහදුවකින් තොරව පානීය ජලය බෙදා හැර තිබුණි. | ප්‍රමාණවත් නොවන බවත්, ඉටු කළ යුතු සේවාවන් බොහෝමයක් ඉටු කිරීමට නොහැකි වූ බවත් | ජල සාම්පල පරීක්ෂා කර පානීය ජලයේ සුරක්ෂිතතාවය තහවුරු කළ යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභා පනතේ 119 ප්‍රකාරව පදිංචිකරුවන්ගේ අවශ්‍යතාවය සඳහා පොදු වෙළඳපළවල් හෝ සති පොලවල් ආරම්භ කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ආදායම් ප්‍රමාණවත් නොවන බැවින් ඉටුකළ යුතු මහජන උපයෝගීතා සේවාවන් බොහෝමයක් අතපසු වී ඇති බව | පනතේ කාර්යයන් ඉටු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මන්රාසි නගරයේ මගී ආවරණයක් ඉදිකිරීම සඳහා රු.500,000 ක ඇස්තමේන්තුවක් මත ඉකුත් වර්ෂයේ නොවැම්බර් 01 දින කොන්ත්‍රාත්කාර ආයතනයකට ඉදිකිරීම පවරා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් අනුමත සැලැස්මට පරිබාහිරව කටයුතු කරමින් අතුරු මාර්ගය හා නව පාලම ඉදිකිරීම සඳහා යොදා තිබුණු තාවකාලික පාලමද අවහිර කරමින් මීටර් 6 x 10 ප්‍රමාණයේ දෙමහල් ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකර තිබුණි. | අදහස් දක්වා නොමැත. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අළුතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන ආයතනවල පහසුකම් සැලසීම සඳහා 2019 සැප්තැම්බර් 12 දින ලැබී තිබුණු මුදලින් අදාල කාර්යය ඉටු නොකර රු.1,855,755 ක ශේෂයක් විගණිත දිනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍යතාවය කඩිනමින් ඉටුකරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ලී බඩු හා සවි කිරීම් ඒකක 45 ක්, වත්කම් ඒකක 16 ක්, ඉඩම් හා ගොඩනැගිලි 05 ක් සහ පොදු වැසිකිළි 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී අදාළ වත්කම්වල වටිනාකම් ගිණුම් තුළ පෙන්නුම් කිරීමට කටයුතු කරන බව | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.1,202,013 ක යන්ත්‍ර උපකරණ, ලී බඩු හා කාර්යාල උපකරණ ඒකක 79 ක් වසර 01 සිට වසර 03 දක්වා කාල පරාසයක සිට නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | කාර්යාලය පිහිටුවීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ගොඩනැගිල්ලක් නොමැතිකම හේතුවෙන් මිලදී ගන්නා ලද ලී බඩු හා කාර්යාල උපකරණ භාවිතා කිරීමට නොහැකි වූ බව | අවශ්‍යතාවය සලකා බලා මිළට ගැනීම් කළ යුතු අතර මිළට ගත් උපකරණ උපයෝජනය කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සැප්තැම්බර් 05 දින සිදු වූ වාහන අනතුර සම්බන්ධයෙන් මූ.රෙ 104 පරීක්ෂණ අවසන් කර නොතිබුණු අතර අදාළ වාහනය අළුත්වැඩියා කිරීමටද කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සභාපතිවරයාගේ ගමන් වෙනුවෙන් කුලී වාහනයක් යොදවාගෙන ඒ සඳහා වර්ෂය තුළ රු. 4,729,849 ක් ගෙවීම් කර තිබුණි. | අදාළ රථය පෞද්ගලික ආයතනයක් වෙත යොමු කර අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් ඉල්ලුම් කර ඇති බව | අළුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. |

**3. 5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රාදේශීය සභාවෙන් ආගරපතන ප්‍රාදේශීය සභාව වෙත අනුයුක්ත කරන ලද සේවකයින් 11 දෙනෙකු වසර 06 සිට වසර 24 දක්වා සේවා කාලයක් ගතවී තිබුණද, සේවයේ ස්ථිර කිරීමට ඇති හැකියාව සොයා බලා ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි. | එක් එක් සේවකයන්ගේ පෞද්ගලික් ලිපි ගොනුවල පවතින අඩුපාඩු නිවැරදි කරමින් පවතින බව | සේවකයින් ස්ථිර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තනතුරු 72 ක පුරප්පාඩු පැවතුණු අතර ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් කම්කරු තනතුරු 33 ක් පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් ආදායම් රැස් කිරීම,මංමාවත් නඩත්තුව සහ කසළ කළමනාකරණය විධිමත් කිරීම කෙරෙහි ගැටළු මතු වී තිබුණි. | පුරප්පාඩු පිළිබඳ පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලුම් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 10 ක සියයට 02 සිට සියයට 100 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 14 සිට සියයට 308 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයන් තුළදී ආදායම් වියදම් නිසි පරිදි ඇස්තමේන්තු කිරීමට කටයුතු කරන බව | අවශ්‍යතාවය සලකා අවධානයෙන් කටයුතු කර අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගරය තුළ රැස්වන කසළ බැහැර කිරීම ප්‍රතිචක්‍රීයකරණය සඳහා අවශ්‍ය ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණු අතර දෛනිකව රැස්වන වන කසළ කිලෝග්‍රෑම් 237.5 ක් බැහැර කර තිබුණි. | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් කෙටි කාලීන හා දිගු කාලීන සැලැසුම් පිළියෙල කිරීමට අපේක්ෂා කරන බව | ඝන අපද්‍රව්‍ය විධිමත්ව කළමනාකරණය කළ යුතුය. |